# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 දෙසැම්බර් මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]

එල්. ඩී.—ඕ. 15/2010

**කැසිනෝ ව්‍යාපාරයක නිරතවීමට අදහස් කරන තැනැත්තන්ට ඔවුන්ගේ කැසිනෝ ව්‍යාපාරයක් පිහිටුවීමට හැකිවීම සඳහා ප්‍රදේශ නම් කිරීම හා ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (1) අමාත්‍යවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක අධිකාරිය යටතේ හැර සහ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිශ්චිත ප්‍රදේශයක් තුළ හැර, කිසිම තැනැත්තකු විසින් 2012 ජනවාරි මස 1 වන දින සිට සහ ඉන් පසු කැසිනෝ ව්‍යාපාරවල නිරත නොවිය යුතු ය. — කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳව තහනම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, කැසිනෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාව පිළිබඳව මහජනතාවට ප්‍රමාණවත් දැනුම් දීමක් ලබාදීම සඳහා, සූදු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, දිනපතා පුවත්පතක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් දැන්වීම් පළකිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී වසර පහක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහක දඩයකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**3.** 2 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රය, එහි නිශ්චිතව දක්වනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය. නියම සහ කොන්දේසි දැක්වීමේ දී අනුගමනය කළ යුතු — බලපත්‍ර, නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

නිර්නායක ද, බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු ආකාරය සහ බලපත්‍රයක් නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි ද නිශ්චිතව දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

**4.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියේ සඳහන් බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත මගින් නියෝග සෑදීමට බලය දී ඇති හෝ නියමිත යම් කරුණක් ;

(ආ) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක ආකෘතිය සහ ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු සහ කැසිනෝ ව්‍යාපාර විසින් ඔට්ටුවක් සඳහා කරනු ලබන විවිධ ක්‍රීඩා සම්බන්ධයෙන් එසේ නිකුත් කරනු ලබන බලපත්‍රය වලංගුව පැවතිය යුතු කාලසීමාව සහ සුදුසු යම් අධීක්ෂණ පියවර ;

(ඇ) බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය ;

(ඈ) බලපත්‍ර අවලංගු කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය,

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝග, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින හෝ එම නියෝග නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසුදිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**5.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස — අර්ථ නිරූපණය.

"කැසිනෝ යන්නෙන්"

(අ) ගෙවීමක් කර හෝ නොකර; නැතහොත්

(ආ) අයිතිවාසිකමක් මත හෝ එසේ නැතිව,

ඔට්ටුවක් සඳහා යම් ක්‍රීඩාවක් කිරීමට පුද්ගලයන්ට ඇතුළුවිය හැකි ස්ථානයක් අදහස් වන අතර ඊට බකාරා, පුන්ටෝ බැංකෝ, බිග්සික්ස්, බ්ලැක් ජැක්, බූවලේ, චෙමින්ඩිෆර්, චක් අ ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, ෆාරෝ, ෆාරෝ බෑන්ක්, හසාඩ්, පෝකර් ඩයිස්, පොන්ටූන්, ඇමරිකානු හෝ ප්‍රංශ රූලේ, ට්‍රෙන්ටේ - එට් ක්වොරන්ටේ, විංග්-එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රීඩාවක් ඇතුළත් වේ.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.